# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 12,768 — 1961 නොවැම්බර් 11 වැනි සෙනසුරාද — 11.11.1961

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)

## I වැනි කොටස : (I) වැනි ඡේදය — සාමාන්‍ය

### ආණ්ඩුවේ නිවේදන

**1961 අංක 8 දරණ හදිසි (විවිධ විධිවිධාන හා බලතල) නියෝග**

1961 අංක 8 දරණ හදිසි (විවිධ විධිවිධාන හා බලතල) නියෝගවල 2 වෙනි නියෝගයෙන් මා වෙත පවරනු ලැබූ බලතල ප්‍රකාර, අග්‍රාමාත්‍ය සිරිමාවෝ රත්වත්තේ ඩයස් බණ්ඩාරනායක වන මම, පහත සඳහන් උපලේඛනයෙහි 1 වෙනි තීරයෙහි නියමිත එක් එක් තැනැත්තන් ඒ නියෝගවල 24 වෙනි නියෝගයෙහි (1) වෙනි ඡේදයෙහි කාර්‍යයන් සඳහා ඒ උපලේඛනයෙහි 2 වෙනි තීරයෙහි අනුරූප සටහනෙහි නියමිත ප්‍රදේශය සඳහා නිසි බලධරයන් වශයෙන් මෙයින් පත් කරමි.

සිරිමා ආර්. ඩී. බණ්ඩාරනායක,
අග්‍රාමාත්‍ය.

1961 නොවැම්බර් 11,
කොළඹ.

### උපලේඛනය

| 1 වෙනි තීරය | 2 වෙනි තීරය |
|---|---|
| වාණිජ, වෙළෙඳ, ආහාර හා නැව් කටයුතු අමාත්‍යාංශයෙහි ස්ථිර ලේකම්<br>වාණිජ, වෙළෙඳ, ආහාර හා නැව් කටයුතු අමාත්‍යාංශයෙහි අතිරේක ස්ථිර ලේකම්<br>ආහාර කොමසාරිස් ... ... ... | ලංකාද්වීපය |
| සම්බන්ධතා නිලධරයා ... ... ... ... | යාපනය පරිපාලන දිස්ත්‍රික්කය |
| ආණ්ඩුවේ දිසාපති ... ... ... ... | වෙනත් එක් එක් පරිපාලන දිස්ත්‍රික්කය |

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.

2051—ජේ. ඇන්. ආර් 20231—6,400 (61/11)